ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2016 ජුලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை,2016 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2016

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- පළමුවන ප්‍රශ්නය ඇතුලු සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. කොළඹ ට නුදුරු ඉතා සුන්දර ග්‍රාමයක් වන ඉංගිරිය ප්‍රදේශයේ සුන්දර ඔයක් දක්නට ඇත. කොළඹට නුදුරු මෙවන් ප්‍රදේශයක එතරම් ලස්සන ඔයක් ඇත්දැයි සිතීම අසීරු කරුණකි. මෙහි දිය නෑමෙන් විනෝද වීමට සති අන්තයේ විශාල පිරිසකුත් සතියේ දිනවල යම් පිරිසකුත් නොකඩවා පැමිණේ.

පියල් රණවීර, ඉංගිරිය මහජන බැංකුවේ ජංගම ගිණුමක් පවත්වාගෙන යන ඉතා විශ්වාසවන්ත ගනුදෙනුකරුවෙකි. බැංකුවේ ස්වයං රැකියා ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය යටතේ රු. 200,000ක ණය මුදලක් ලබා ගෙන 2015.01.01 දින "ගමේ කඩේ" නමින් බොජුන් හලක් ආරම්භ කළේ ය. සාධාරණ මිලකට පිරිසිදු ආහාර වේලක් සහ කෙටි කෑම වර්ග සැපයීම ඔහුගේ අරමුණ විය.

තවද 2015.01.01 දින ආරම්භ කළ ඔහුගේ ඔහුගේ ව්‍යාපාරය සඳහා තමා ඉතිරි කර ගෙන තිබු රු. 120,000 ක් හා රු. 300,000ක් වටිනා ගොඩනැගිල්ල ද යෙදවී ය. ඔහුගේ උනන්දුව හා පරිශ්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන් ආරම්භයේ ව්‍යාපාරයට හොඳ ඉල්ලුමක් පැවතිය හ. මේ සඳහා ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ ද සහයෝගය ලැබිණි.

ඔහුගේ මෙම ව්‍යාපාරය සඳහා පළමු මාසයේ පහත වියදම් දිරීමට සිදුවිය.

| | |
|---|---|
| ආහාර සඳහා | රු. 50,000 |
| විදුලිය | රු. 10,200 |
| ජල බිල්පත | රු. 7,100 |
| ප්‍රචාරණය | රු. 2,300 |

එහෙත් ඔහු මාසය අවසානයේ රු. 210,000 ක ආදායමක් ලබා ගන්නා ලදි.

i. මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් ද?

ii. ඔහුගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද ? ඒ ඇයි ?

iii. මෙම ව්‍යාපාරයේ අළෙවි කළ හැකි වෙනත් භාණ්ඩ වර්ග මොනවා ද?

iv. මෙම ව්‍යාපාරය කුමන වෙළෙඳාමක් ලෙස සැලකිය හැකි ද? එහි ලක්ෂණයක් නම් කරන්න.

v. මෙම ව්‍යාපාරය ඇරඹීමේ දි ඇති වු මූලික ගිණුම් සමීකරණයේ ගනුදෙනු වටිනාකම් සහිතව ලියන්න.

vi. 2015.01.01 දින මුළු වත්කම් ප්‍රමාණය කොපමණ ද?

vii. මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම කොපමණද ?

viii. 2015.01.01 දින ආරම්භ කළ මෙම ව්‍යාපාරයේ සිදු වු එම සිද්ධීන් වාර්තා කළ යුතු මූලික පොත නම් කරන්න.

ix. පියල් මහතා විසින් ලබා ගත් බැංකු ණය කුමන ගිණුම්කරණ මූලර්මයකට අයත් වේ ද?

x. "ගමේ කඩේ" ජනවාරි මාසයේ ලාභය කීයද ?

*(ලකුණු 02 x 10 = 20 යි)*

## I **කොටස - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

02. i. අවශ්‍යතා හා වුවමනා වල ලක්ෂණ 2 බැගින් ලියන්න.

ii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

❖ ප්‍රාග්ධනය නිෂ්පාදන සාධකයකි.

❖ තොග වෙළෙඳ ආයතන, සිල්ලර වෙළෙඳ ආයතන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර වේ.

❖ විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමකි.

❖ සේවකයන්ගේ විශේෂිත දැනුම හා කැපවීම ව්‍යාපාරයක ශක්තියකි.

iii. ස්වරූපය අනුව වර්තමානයේ වර්ග කළ හැකි සිල්ලර වෙළෙඳ සැල් මොනවා ද?

iv. ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් හඳුනා ගත හැකි ශක්තීන් හා දුර්වලතා දෙක බැගින් ලියන්න.

*(ලකුණු 8 යි)*

03. i. අයිතිය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ගැලීම් සටහන ඇඳ දක්වන්න.

ii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

❖ රජය පත්කරන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සංස්ථා පාලනය කෙරේ.

❖ 1840 වංචා වැළැක්වීමේ ආඥා පනතට අනුව සියලු ම හවුල් ව්‍යාපාර ලිඛිත ගිවිසුමක් යටතේ ආරම්භ කළ යුතුය.

❖ ගණකාධිකාරිවරු, නීතිඥයින්, බදු නිලධාරින් හා වෛද්‍යවරු වැනි වෘත්තීන් වල යෙදී සිටින අය බොහෝ විට ආරම්භ කරනුයේ හවුල් ව්‍යාපාර ය.

❖ සිතුම්ණා පෙරේරා ඔහු සිතුම්ණා ස්වීට් හවුස් නමින් තනි ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ. මෙය ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කළ යුතුය.

iii. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් අත්කර ගත හැකි ප්‍රයෝජන මොනවාද ?

iv. රාජ්‍ය දෙපාර්තමේන්තුවක වාසි හා අවාසි 2 බැගින් ලියන්න

*(ලකුණු 8 යි)*

## II **කොටස - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

04. අ. පහත දැක්වෙන්නේ වෙළෙඳ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයකි.

1/1 අයිතිකරු රු. 100,000ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම.

1/4 රු. 50,000ක බැංකු ණය මුදලක් ලබා ගැනිම

1/12 රු. 80,000 ලී බඩු ණයට ගැනිම

1/19 රු. 2,400 දුරකථන බිල්පත් ගෙවීම

1/25 රු. 25,000ක බඩුතොගයක් ණයට ගැනිම

**අවශ්‍යවන්නේ,**

ඉහත එක් එක් ගනුදෙනුව අදාලා මුලාශ්‍ර ලේඛණය හා එම ගනුදෙනුව හර වන ගිණුම හා බැර වන ගිණුම ලියා දක්වන්න. (පිළිතුරු සැපයීමේ දී පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න.)

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛණය | හර වන ගිණුම | බැර වන ගිණුම |
|---|---|---|---|
| 01 | ලදු පත | මුදල් ගිණුම | ප්‍රාග්ධන ගිණුම |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

ආ පහත ආකෘතිය භාවිත කරමින් ඉහත ගනුදෙනු ගිණුම් සමීකරණයට බලපාන අයුරු දක්වන්න. (1) ගනුදෙනුව සටහන් කරන ආකාරය නිදසුන් ලෙස දක්වා ඇත.

| ගනුදෙනු අංක | වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| 01 | මුදල්<br>+ 100,000 | ප්‍රාග්ධනය<br>+ 100,000 | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

ඉ. ඉහත ගනුදෙනු පහත දක්වා ඇති අයුරින් ලෙජර් ගිණුම් විවෘත කොට එහි සටහන් කර පෙන්වන්න. අංක 1 ගනුදෙනුව නිදසුන් ලෙස දක්වා ඇත. අවසානයේ ලෙජර් ගිණුම් තුලනය කර දක්වන්න.

**මුදල් ගිණුම**

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම | දිනය | විස්තරය | ස.පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 01/01 | ප්‍රාග්ධනය | | 100,000 | | | | |

**ප්‍රාග්ධන ගිණුම**

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම | දිනය | විස්තරය | ස.පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | | | 01/01 | මුදල් | | 100,000 |

*(ලකුණු 12 යි)*

05. i. සිහිවටන තීරු යනු කුමක් ද?

ii. වට්ටමක් යනු කුමක් ද?

iii. පහත දැක්වෙන ගනුදෙනු ඇසුරෙන් මුදල් පොතක් පිළියෙල කරන්න.

1/1 ප්‍රාග්ධනය යෙදුවා රු. 75,000

1/5 අත්පිට විකුණුම් රු. 23,000

1/7 අත්පිට ගැනුම් රු. 30,500

1/10 සිරිපාලට ගෙව්වා රු. 9,800 (වට්ටම රු. 200)

1/14 ණයට ගැණුම් රු. 18,000

1/16 විදුලි බිල ගෙව්වා රු. 12,100

1/20 රක්ෂණය ගෙව්වා රු. 7,200

1/23 කසුන්ගෙන් මුදල් ලැබුණා රු. 4,600 (වට්ටම රු. 400)

1/27 ගෙවල් කුලි ලැබුණා රු. 11,000

1/30 සුමුදු ට ගෙවිය යුතු රු 10,000 ගෙවීමේ දි 10% වට්ටමක් ලබා දුනි.

*(ලකුණු 12 යි)*

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර විසින් සම්පාදිත යි.